**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -2 කොටස - 2020**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 2 කොටස 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මේ වන විට ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර දක්වා) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කරමින් යෝජිත හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාණිජ අගනගරය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධයක් ඇති කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ණය ගිවිසුමට ප්‍රකාරව, ව්‍යාපෘතියේ 02 වන කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගය බෙලිඅත්ත සිට වැටිය දක්වා කිලෝමීටර් 26 ක් දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 60,601.60 ක් වූ අතර, එයින් සියට 85 ක් වූ එ.ජ.ඩො. මිලියන 360.29 කට සමාන වූ රු. මිලියන 46,920 ක් සිවිල් හා උපදේශන කටයුතු සඳහා චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. එ.ජ.ඩො. මිලියන 63.58 ක් වූ ඉතිරි සියයට 15 ක ප්‍රමාණය ශ්‍රී ලංකා හැටන් නැෂනල් බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ - 02 කොටස යටතේ වූ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 27 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවීමට සිදුවූ ප්‍රමාද පොලිය සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව සිදු කර නොතිබුණි. | සියලුම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම ජොෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ සිදු කරන ලදී. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 2 කොටසේ ව්‍යපෘති කාර්යාලයට මූල්‍ය බලතල කිසිවක් පවරා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති රු. මිලියන 9.09 ක ආපසු නොගෙවූ රඳවා තබා ගැනීම්, ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සියලුම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදුකරනු ලැබේ. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - 2 කොටසේ ව්‍යාපෘති කාර්යාලයට මූල්‍ය බලතල කිසිවක් පවරා නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී රඳවා තබාගත් මුදල් වෙනුවෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 14.8 උප වගන්තියට අනුව සහතික කරන ලද අතුරු ගෙවීම් සහතික සඳහා ගෙවීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 31.65 ක මූල්‍ය ගාස්තු ගෙවීමට සිදු වුවද, සිදුවිය හැකි වගකීම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෝ හෙළිදරව් කර නොතිබුණි. | මෙම වගකීම ඇවර කිරීම් (winding up) සම්බන්ධ මූල්‍ය ප්‍රකාශනවලදී හඳුනා ගැනීමට සටහන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සැළසිය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මෙහෙයුම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලට අදාළ මුදල් ගලා ඒම් සහ ගලායාම් හඳුනාගෙන නොතිබුණි. | එකඟ වෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීම අවශ්‍ය වේ. |

**2.2 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| අංකය | රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 21.4 වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ආනයනය කරනු ලබන සිවිල් වැඩ සඳහා භාවිතා කරනු ලබන උපකරණ, යන්ත්‍රෝපකරණ, වාහන, අමුද්‍රව්‍ය, සියලුම උපාංග සහ අනෙකුත් සියලුම පරිභෝජන ද්‍රව්‍ය රේගු බදු වලින් නිදහස් කෙරෙන අතර එම භාණ්ඩ ව්‍යාපෘතිය අවසානයේ කොන්ත්‍රාත්කරු විසින් නැවත අපනයනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 25 දින සැලකිය යුතු ලෙස නිම කර (Substantially completed) තිබුණු අතර එම නිසා දෝෂ දැනුම්දීමේ කාලය 2021 පෙබරවාරි 24 දිනට | කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් තීරුබදු සහ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. කෙසේ වෙතත්, එම ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සටහන් කර ඇත. | ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අවසන් වුවද, විගණනය කළ 2021 නොවැම්බර් 09 දිනට ඉන්වොයිසි 66 න් ඉන්වොයිසි 02 ක් යටතේ ආනයනය කරන ලද භාණ්ඩ පමණක් ප්‍රති අපනයනය කර ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 4.2 උප වගන්තිය. | අදාළ කොන්ත්‍රාත්කරුගෙන් කාර්ය සාධන ඇපකර පිරිවැය අයකර ගැනීමෙන් තොරව කාර්ය සාධන ඇපකරය ලබාගැනීමේ පිරිවැය අයකර ලබාගැනීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ දෙමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ වූ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් යොදා තිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 දින දක්වා කාර්ය සාධන ඇපකර පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 455 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවද, ඉහත ගෙවීම ප්‍රමාණ පත්‍ර ප්‍රතිපාදනය රු. මිලියන 230.17 කින් ඉක්මවා යාමක් බවත් කොන්ත්‍රාත්කරුට විශේෂ වාසියක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය විය. | කාර්ය සාධන ඇපකරය ඔහුගේම වියදමින් සැපයිය යුතු ලෙසට කොන්ත්‍රාත් කොන්දේසිවල ප්‍රකාශ කරන්නේ, කාර්ය සාධන ඇපකර ඉදිරිපත් කිරීම පාර්ශව අතර ගිවිසුමකට එළඹීමට පූර්ව අවශ්‍යතාවයක් වන නිසා වන අතර වෙන්කළ ප්‍රතිපාදන (PS) අයිතම 107(2) යටතේ ප්‍රමාණ පත්‍රවල කාර්ය සාධන ඇපකර පිරිවැය අයකර ගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ලැබේ. කොන්ත්‍රාත් අවසන් කිරීම සඳහා නිරන්තර කාල දීර්ඝ කිරීම් හේතුවෙන් කාර්ය සාධන ඇපකර සැපයීමේ තථ්‍ය පිරිවැය වැඩි වී තිබුණි. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර සති 26 ක් තුළ ඉඩම් කටයුතු කඩිනම් කර අවසන් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට රු. මිලියන 14.82 ක දිරි දීමනා ගෙවා තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පැවතිණි. | සියලුම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම SPD කාර්යාලයේ සිදු කරන ලදී. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - 2 කොටස ව්‍යාපෘති කාර්යාලයට කිසිදු මූල්‍ය අධිකාරියක් පැවරී නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 1,868.69 ක් සහ ප්‍රමාද පොලී ලෙස රු. මිලියන 145.65 ක් ගෙවා තිබුණද, ඉඩම් | සියලුම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම SPD කාර්යාලයේ සිදු කරන ලදී. ඒ | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | කට්ටි සංඛ්‍යාව පිළිබඳ අදාළ විස්තර විගණනයට ලබා දී නොතිබුණි. | අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - 2 කොටස ව්‍යාපෘති කාර්යාලයට කිසිදු මූල්‍ය අධිකාරියක් පැවරී නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | හෙක්ටයාර 245.1147 කින් සමන්විත ඉඩම් කට්ටි 2,884 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට අත්පත් කරගෙන ඇතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට එවැනි ඉඩම්වලින් හෙක්ටයාර 3.0152 කින් සමන්විත කට්ටි 18 ක අයිතිය පමණක් පැවරීමට ව්‍යාපෘතියට හැකි වී තිබුණි. | සියලුම ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම SPD කාර්යාලයේ සිදු කරන ලදී. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - 2 කොටස ව්‍යාපෘති කාර්යාලයට කිසිදු මූල්‍ය අධිකාරියක් පැවරී නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ 8.33 පරිච්ඡේදයේ සේවා ප්‍රදේශ ස්ථාන දෙකක් සඳහන් කර තිබුණද, එය ඇස්තමේන්තු කර නොතිබූ අතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ මුළු දිගුව සඳහාම සේවා ප්‍රදේශ ඉදිකිරීමට ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින්, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 46 න් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා සේවා ප්‍රදේශයක් නොතිබුණි. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර කිසිවක සංකල්පීය අවධියේදී (Conceptual stage) සිවිල් වැඩ කොන්ත්‍රාත්තු හරහා සේවා ප්‍රදේශය ඉදිකිරීමට ප්‍රතිපාදන සපයා නැත. | සේවා ප්‍රදේශ සඳහා පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |